SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | S

# ඉතිහාසය

නම ..............................................
කාලය පැය දෙකයි

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. අතීත ශ්‍රී ලාංකික සමාජයේ ගොඩ ගොවිතැන ................................... ලෙසද හඳුන්වා ඇත. (හේන් ගොවිතැන / මඩ ගොවිතැන /කුඹුරු ගොවිතැන)
02. හේන් වගාව .................................... ''සේන්'' නමින් දක්වා ඇත. (සෙල්ලිපි වල/ උම්මග්ග ජාතකයෙහි/ සිහලවත්ථු නම් ග්‍රන්ථයේ)
03. වාරි කර්මාන්ත වලට කළ විශිෂ්ඨ සේවය නිසා .................................. මින්නේරි දෙවියන් ලෙස ප්‍රසිද්ධ විය. (කාවන්තිස්ස රජු/ දුටුගැමුණු රජු/ මහසෙන් රජු)
04. අනුරපුර යුගයේ අභ්‍යන්තර වෙළඳාමට සම්බන්ධ වෙළඳ ගම් ................................ ලෙස හඳුන්වා ඇත. (පටුන්ගම්/ පුග/ නිගම)
05. වසභ රජතුමා ................................ පෙළපතට අයත් පාලකයෙකි. (මෞර්ය/ ලම්බකර්ණ/ මානවම්ම)

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. තෝනිගල සෙල්ලිපියේ අකලහස ලෙස දක්වා ඇත්තේ යල කන්නය. ( )
07. තෙල් පොඟවන ලද පහන් තිර කුඹුරේ පත්තු කිරීම මැස්සන් මර්දනයට අතීත මිනිසා යෙදූ ස්වභාවික ක්‍රමයකි. ( )
08. අතීත ගොවියා ගවයන්ගෙන් ලබා ගත් පෝෂක ද්‍රව්‍ය පහක් පස්ගෝරස ලෙස හඳුන්වයි. ( )
09. අතීතයේ තඹ කර්මාන්තයේ යෙදුන අය ලෝකුරුවන් ලෙස හඳුන්වා ඇත. ( )
10. ලංකාවේ වෙළඳාම දියුණු වීමත් සමඟ බිහිවූ වෙළඳ නගර නිගම ලෙස හඳුන්වා ඇත. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.



11. පින්තූරයේ දක්වෙන උපකරණ අතීත ජන ජීවිතයේදී භාවිතා කළේ කුමන ජීවන වෘත්තියක කටයුතු කිරීමේදී ද?
01. ගොවිතැන
02. සත්ව පාලනය
03. අභ්‍යන්තර වෙළඳාම
04. බාහිර වෙළඳාම

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

12. අතීතයේ දේශීය වෙළඳාමට සම්බන්ධ අය වෙනම සංවිධානය වී සිටියහ. එවැනි වෙළඳ සංවිධාන හැඳින්වූයේ කුමන නමින් ද?

01. වලඤ්ඤියාර් 02. පුග 03. නානාදේසි 04. නිගම

13. ශ්‍රී ලංකාව අතීතයේ දී කළ විදේශ වෙළඳාමේ දී වැදගත් වූ වරායක් දක්වෙන පිළිතුර තෝරන්න.

01. අනුරාධපුරය 02. මාගම 03. ගොඩවාය 04. පොළොන්නරුව

14. අනුරාධපුර රාජධානි අවධියේ රාජ්‍ය කළ 8 වන අග්ගබෝධි රජතුමා තම මවට උපස්ථාන කළ බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?

01. දීපවංශය 02. මහාවංශය 03. සීහලවත්ථුප්‍රකරණය 04. චූලවංශය

15. ලංකාවේ I වන සේන රජුගේ පාලන කාලය තුළ දකුණු ඉන්දියාවේ බලවත් වූ රාජ්‍ය කුමක් ද?

01. පල්ලව රාජ්‍ය 02. මදුරාසිය 03. පාණ්ඩ්‍ය රාජ්‍ය 04. චෝල රාජ්‍යය

• අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| කර්මාන්තය | නිෂ්පාදන ශිල්පියා | නිෂ්පාදනය |
|---|---|---|
| 16. ...................................... | කුම්භකාර | 17. ...................................... |
| කපු | 18. ...................................... | රෙදිපිළි |
| 19. ...................................... | ස්වර්ණකාර | 20. ...................................... |

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

පහත සඳහන් වන්නේ අතීත ජීවන වෘත්තීන් සමඟ සම්බන්ධ ප්‍රකාශ කීපයකි. ඒවාට අදාළ පිළිතුර එම ප්‍රකාශය ඉදිරියෙන් ලියා දක්වන්න.

අ. I වගාවට අවශ්‍ය ජලය රඳවා තබා ගැනීමට හා ක්‍රමානුකූලව ජලය පිට කිරීමට ගොවියා කුඹුරේ සෑදූ අංගය ...................................................

II හේන ගිනි තැබීමට පෙර සතුන් පන්නා දැමීමට කරන කෑගැසිල්ල ..........................................

III කිරි ලබා ගන්නා කිරි දෙනුන් හැඳින්වීමට යොදන නම ......................................

IV වෙළඳාම දියුණුවීමත් සමඟ බිහිවූ විදේශ වෙළඳ ශ්‍රේණි හඳුන්වන නම ......................................

(ල. 4)

ආ. පහත A කොටසේ දී ඇති සිදුවීම් හා සම්බන්ධ රජතුමා B කොටසින් තෝරා ඉදිරියෙන් ලියන්න.

| A කොටස | B කොටස |
|---|---|
| I රෝමයෙන් පබලු ගෙන්වීම ........................................................... | පණ්ඩුකාභය රජතුමා |
| II බදුලු ටැම් ලිපිය කරවීම ........................................................... | මහාචූලි මහා තිස්ස රජතුමා |
| III සොහොන් පල්ලන් පත්කිරීම ........................................................... | IV වන උදය රජතුමා |
| IV වෙස් වලාගෙන කුඹුරක අස්වනු නෙළීම ........................................................... | භාතිකාභය රජතුමා |

(ල. 4)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ඇ. පහත සඳහන් සිදුවීම් වලට අදාළ රජවරුන්ගේ නම් එම සිදුවීම් වලට අදාළ ප්‍රකාශ ඉදිරියෙන් ලියා දක්වන්න.

I පල්ලව රජෙක් වූ 2 වන නරසිංහ වර්මන්ගෙන් උදව් ගෙන හත්ථදාඨ රජුට එරෙහිව සටන් කළ පාලකයා ..............................

II ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ලංකාව ආක්‍රමණය කරන විට මෙරට සිටි පාලකයා ................................

III කුට්ඨක සෙනෙවි යොදවා පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කල පාලකයා ......................................

IV මිහින්තලය ප්‍රදේශයේ රෝහලක් ඉදිකළ පාලකයා .................................

(ල. 4)

ඈ. පහත වගුවේ සඳහන් වන්නේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් හා ආර්ථික සුභ සාධනය සම්බන්ධයෙන් පනවන ලද නීති කිහිපයකි. එම නීති සඳහන් වන සෙල්ලිපි ඊට ඉදිරියෙන් ලියන්න.

| | නීතිය | සෙල්ලිපිය |
|---|---|---|
| 1. | දසගම් හා අපරාධ නඩු විසඳීම සම්බන්ධ නීති | .............................................. |
| 2. | රාජ්‍ය නිලධාරීන්ට හා ආයතන වලට දෙන ලද වරප්‍රසාද සඳහන් ලේඛනය | .............................................. |
| 3. | මූල්‍ය කළමණාකරණ පිළිබඳ දැක්වෙන නීති | .............................................. |
| 4. | විහාරාරාම වලට දිනපතා වැයවන මුදල් පිළිබඳ ලියා තැබූ පොත | .............................................. |

(ල. 4)

02. I පහත සඳහන් වන්නේ හේන් වගාව පිළිබඳව ඓතිහාසික මූලාශ්‍ර වල සඳහන් වචන කිහිපයකි. ඒවා අඩංගු මූලාශ්‍ර නම් කරන්න.

A හේන 'පිටබිම්' නමින් හඳුන්වා තිබීම. ..............................................

B එකම පවුලක සොයුරන් පස් දෙනෙකු උඳු වැපිරීමට හේනක් කෙටූ බව දැක්වීම. ..............................................

C සාලිය කුමරු උපන් වසරේ ඇල් වී අස්වැන්න ඉහළ ගිය බව දැක්වීම. ..............................................

(ල. 3)

II I පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද?

II මෙය වැඩි වශයෙන් යොදා ගත්තේ කුමන වගාවක් ආරක්ෂා කර ගැනීමට ද?

III මෙම ආරක්ෂක උපක්‍රමය හැඳින්වීමට වගාව ආශ්‍රිත බස් වහරේදී යොදා ගත් නම කුමක් ද?

IV වගා කළ හේන් ආරක්ෂාව සඳහා යෙදූ තවත් ආරක්ෂක උපක්‍රමයක් ලියන්න.



(ල. 4)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

III මධ්‍ය පාලනයේදී පහත සඳහන් කාර්යයන් සම්බන්ධව සිටි නිලධාරීන් හඳුන්වන නම් සඳහන් කරන්න.

I අනාගත රාජ්‍ය පාලනයට පුහුණුව ලද තැනැත්තා ..............................................

II ලේඛන කටයුතු භාර නිලධාරීන් ..............................................

III අශ්වයන් පිළිබඳ කාර්යංශයේ ප්‍රධානියා ..............................................

IV ඇතුන් පිළිබඳ කාර්යංශයේ ප්‍රධානියා ..............................................

(ල. 4)

03. I පහත සඳහන් වන්නේ අතීත ගොවියා කුඹුරු ගොවිතැනේ වගාකළ කන්න "තෝනිගල" සෙල්ලිපියේ දක්වා ඇති ආකාරය සහ එම කන්න වර්තමානයේ හඳුන්වන ආකාරයයි. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| සෙල්ලිපියේ සඳහන් ආකාරය | එම කන්න වර්තමානයේ සඳහන් වන ආකාරය |
|---|---|
| අකල හස | 01. ................................ |
| 02. ...................................... | මැද කන්නය |
| පිට දඩහස | 03. ................................ |

(ල. 3)

II අතීත කුඹුරු ගොවිතැනේ දී ගොවියා පරිසරයට හානි නොවන ආකාරයට අනුගමනය කළ වගා ක්‍රම 04 ක් නම් කරන්න.

III අ. අතීත ගොවියා වී ආහාරයට සුදුසු වන ලෙස කැකුළු සහල් හා තැම්බූ සහල් ලෙස සකස් කර ගත් ආකාරය ලියන්න. (ල. 2)

ආ. අතීත ගොවියා ඊළග කන්නය වගා කටයුතු ආරම්භ කරන තෙක් ධාන්‍ය ආරක්ෂා කිරීමට යෙදූ උපක්‍රමයක් සඳහන් කරන්න. (ල. 2)

04. I පහත දැක්වෙන්නේ අතීත ජනතාවගේ ජීවන වෘත්තියක් වූ සත්ත්ව පාලනයේ දී කළ ක්‍රියාකාරකම් කිහිපයකි. ඒවාට භාවිතා වන වචන එම ක්‍රියාකාරකම් ඉදිරියෙන් ලියා දක්වන්න.

A ගවයන් රැකබලා ගැනීම හා තණ කැවීම කළ පුද්ගලයන් ..............................................

B භාණ්ඩ හා මිනිසුන් ප්‍රවාහනයට යොදාගත් ගවයන් බැඳි කරත්ත ..............................................

C ගවයන්ගේ පිටේ භාණ්ඩ රැගෙන යාම .............................................. (ල. 3)



II පින්තූරය ඇසුරෙන් පිළිතුරු සපයන්න. (ල. 2)

I පින්තූරයේ දැක්වෙන උපකරණය කුමක්ද? (ල. 2)

II එය උපයෝගී කර ගත්තේ කුමන ගොවිතැනක් සම්බන්ධයෙන් ද? ඒ කුමන කාර්යකට ද?

III අතීත ජනතාව ගව පාලනයෙන් හා කුකුළු පාලනයෙන් ලබා ගත් ප්‍රයෝජන දෙක බැගින් දක්වන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

I ගව පාලනය
- 01. ...........................................................................................
- 02. ...........................................................................................

II කුකුළු පාලනය
- 01. ...........................................................................................
- 02. ...........................................................................................

(ල. 4)

05\. I අතීත ජනතාව ලෝහ කර්මාන්තයේදී භාණ්ඩ නිෂ්පාදනයට භාවිතා කළ ලෝහ වර්ග 03 ක් නම් කරන්න. (ල. 3)

II පහත වගුවේ පින්තූර වලින් දක්වා ඇත්තේ කර්මාන්ත කිහිපයක භාවිතා කළ උපාංග කිහිපයකි. එම උපාංග උදව් කර ගෙන වගුව සම්පූර්ණ කරන්න.

| කර්මාන්තය | ශිල්පීන් | නිෂ්පාදන භාණ්ඩය | උපාංගය |
|---|---|---|---|
| 01. ............................ | ලෝකුරුවන් | 02. ............................... |  |
| 03. .............................. | කුඹල්ලු | 04. ................................ |  |

(ල. 4)

III අතීත ශිල්පීන් කළ කෘෂි නිෂ්පාදන 02ක් නම් කර ඒ ආශ්‍රිත කර්මාන්ත 02ක් නම් කරන්න. (ල. 3)

06\. I ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම නිසා වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් 03ක් නම් කරන්න.

II ශ්‍රී ලංකාව විදේශ රටවල් සමඟ කළ වෙළඳාම ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආනයනය කළ භාණ්ඩ | අපනයනය කළ භාණ්ඩ |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |

(ල. 4)

III අතීත සමාජයේ අවමංගල උත්සව හා බැඳුන මිනිසා සතු වූ උසස් ගුණාංගයන් 02ක් නම් කර පැහැදිලි කරන්න. (ල. 2x2)=4

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

07. I පහත සඳහන් වන්නේ මානවම්ම රජ පෙළපත අනුරපුර පාලනය කරන කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් කිහිපයකි. ඒ අතරින් මානවම්ම රජුගේ කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් 03 ක් නම් කරන්න.

- පළමුවන නරසිංහ වර්මන් රජුට සේවය කිරීම.
- ලංකාවට පාණ්ඩ්‍ය ආක්‍රමණ එල්ල වීම.
- මහවලි ගඟේ මිනිපේ නම් ප්‍රදේශයේ අමුණක් ඉදි කිරීම.
- හත්ථදාඨ රජු පරාජය කිරීම.
- පාණ්ඩ්‍ය රජු සමඟ සාම ගිවිසුමක් අත්සන් කිරීම.
- පාණ්ඩ්‍ය රාජධානිය ආක්‍රමණය කිරීම.

රටේ සාම්ප්‍රදායික පරිපාලන තන්ත්‍රය නැවත පිහිටුවීම. (ල. 3)

II අනුරපුර යුගයේ රජවරු රටේ ආරක්ෂාව සඳහා පහත සඳහන් ක්ෂෙත්‍රයන් සම්බන්ධයෙන් කළ කාර්යයන් 03 ක් ලියන්න.

A රජුගේ හමුදාව ............................................

B නගරය නිර්මාණය කිරීම ............................................

C දේශීය විදේශීය සතුරු හමුදා වලින් බේරීම ............................................ (ල. 3)


III පහත හරස්පද උපයෝගි කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

01. රජවරු හෝ උසස් නිලධාරීන් යම් පුද්ගලයන්ට දෙන වරප්‍රසාද ජනතාවට දැනුවත් කිරීමට මෙම ලේඛන සාදන ලදි.
02. රට්ඨ ලෙස හැඳින් වූ පරිපාලන ඒකක පාලනය කළේ මෙම නිලධාරීන් ය.

<u>පහළට</u>

01. පළමුවන උපතිස්ස රජු රෝහලක් නිර්මාණය කළේ මොවුන් සඳහා ය.
02. අනුරපුර නගරයේ ආරක්ෂාවට මේවා ඉදිකර තිබුණි.
03. බුදු දහම ලංකාවට ලැබුණු පසු සෑම රජෙක්ම මෙම ක්ෂේත්‍රයේ උන්නතියට කටයුතු කරන ලදි. (ල. 5)




SLGURU.LK
For Educational Purpose Only

“The only person who is educated is the one who has learned how to learn and change.” — Carl Rogers

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

පළමු වාර පරීක්ෂණය - 2019
7 ශ්‍රේණිය - ඉතිහාසය
පිළිතුරු පත්‍රය

**I කොටස**

01. හේන් ගොවිතැන 02. උම්මග්ග ජාතකය 03. මහසෙන් 04. පටුන්ගම් 05. ලම්භකර්ණ
06. (X) 07. (✓) 08. (✓) 09. (X) 10. (✓) 11. ගොවිතැන 12. පුග 13. ගොඩවාය 14. මහාවංශය
15. පාණ්ඩ්‍ය රාජ්‍යය 16. මැටි 17. වළං 18. පෙහෙකාර 19.රන් 20. මාල වළලු (ලකුණු 20X2= 40)

**II කොටස**

01. අ.I ලියදි II ගිනියාතිකාව III කිරිගෙරි IV වලඤ්ඤාර්/ කානාදේසි (ලකුණු 4)
ආ. I භාතිකාභය රජු II IVවන උදය රජු III පණ්ඩුකාභය රජු IV මහාචූලි මහා තිස්ස රජු (ලකුණු 4)
ඇ. I මාන කුමාරයා II පළමුවන සේන III දෙවන සේන IV දෙවන සේන (ලකුණු 4)
ඈ. 1. වේවැල්තැටිය 2. අත්තානි කණු 3. මිහින්තලේ පුවරු ලිපිය 4. පඤ්චිකා පොත (ලකුණු 4)
02. I A සෙල්ලිපිය B මහා වංශයේ C සිහල වත්ථු නම් පැරණි ග්‍රන්ථය (ලකුණු 3)
II i හිසට වළඳක් නමා ගත් පඹයා ii හේන් වගාව iii හැලිකටා
iv දඩුවැටි දැමීම / පැල් රැකීම / ගිනි ගොඩවල් ගැසීම. (ලකුණු 4)
III i යුව රජු ii ලේඛක iii අග අදෙක iv අති අදෙක (ලකුණු 4)
03. I 1. මහ කන්නය 2. මදහස 3. යල කන්නය (ලකුණු 3)
II
- සී සෑමට නගුල බැඳි මී ගවයින් යොදා ගැනීමෙන් පස් පෙරළී වල් පැල තැලී පොඩි වී පොහොර බවට පත් වීම.
- මැස්සන් මර්දනයට ස්වභාවික ක්‍රම භාවිතය - තෙල් පොගවන ලද පහන් තිර පත්තු කිරීම තුළින්
- නගුලෙන් සී සෑමේදී පසට හානි නොවීම. (යන්ත්‍ර වලින් සී සෑමේදී පොළොවට වන හානිය වැඩි වීම)
- වගාව ආරක්ෂාවට නියර වල පොල්පිති සිටුවීම. (ලකුණු 4)

III අ. කැකුළු සහල් - නොතැම්බූ වී කොටා කැකුළු සහල් සෑදීම.
තැම්බූ සහල් - තැම්බූ වී කොටා සකස්කර ගන්නා ලදි. (ලකුණු 2)
ආ. වී බිස්සක් සෑදීම තුළින් (ලකුණු 2)
04. I A ගොපල්ලන් B ගැල් මීවුන් / ගැල් ගොන් C තවලම (ලකුණු 3)
II I දැකැත්ත ii කුඹුරු ගොවිතැන / ගොයම් කැපීමට (ලකුණු 2)
III i ගව පාලනය - ප්‍රවාහනය, කෘෂිකර්මාන්තය, කිරි ලබා ගැනීම
ii කුකුළු පාලනය - බිත්තර, මස් ලබා ගැනීම. (ලකුණු )
05. I යකඩ, තඹ, රන්, රිදී (ලකුණු 3)
II 1. ලෝහ 2. යකඩ භාණ්ඩ (උදලු කැති ආදිය) 3. මැටි 4. වළං (ලකුණු 4)
III උක් - පැණි හකුරු කර්මාන්තය කපු - රෙදිපිළි කර්මාන්තය (ලකුණු 2x2=4)
06. I ඉන්දියාව, චීනය, රෝමය, පර්සියාව, අරාබිය (03ක් දක්වන්න)
II ආනයනය කළ භාණ්ඩ - පිඟන්, සේද රෙදි, සුවඳ විලවුන්, අශ්වයන්
අපනයනය කළ භාණ්ඩ - ඇත්දත්, මුතු මැණික්, කුළු බඩු වර්ග
III *අවමංගල කටයුතු සඳහා මුදල් පරිත්‍යාග කිරීම. *භාණ්ඩ පරිත්‍යාග කිරීම.
*ආගමික ස්ථාන අසලින් අවමගුල් පෙරහර යන විට මළ බෙර වාදනය නොකිරීම.
*දුක සැප බෙදා ගැනීම (ලකුණු 2x2=4)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

07. I පළමුවන නරසිංහ වර්මන් රජුට සේවය කිරීම.
හත්ථදාඨ රජු පරාජය කිරීම.
රටේ සම්ප්‍රදායික පරිපාලන තන්ත්‍රය නැවත පිහිටුවීම (ලකුණු 3)

II A රජුගේ හමුදාව - ඇත්, අස්, රිය, පාබල ලෙස චතුරංගනී සේනාව සෑදීම

B නගර නිර්මාණය - නගර ප්‍රාකාර, වාසල් දොරටු, ආරක්ෂාව සම්බන්ධයෙන් ඉදි කිරීම.

C දේශීය විදේශීය සතුරු හමුදා වලින් බේරීම - බලකොටු ඉදිකිරීම, ආරක්ෂක ස්ථාන වල මුරකාවල් ඉදි කිරීම. (ලකුණු 3)

III හරහට 1. අන්තානි 2. රට ලද්දන්
පහළට 1. අන්ධයින් 2. වාසල් දොරටු 3. ශාසනික (ලකුණු 5)

SLGURU.LK
For Educational Purpose Only